# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2014

## Primary Piriven Year End Term Test - 2014

3 වසර / Grade 3

**සිංහල**
**Sinhala**

කාලය : පැය තුනයි
Time : Three hours

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

   i. අනගාරික ධර්මපාලතුමා
   ii. ගුරුවරුන්ට සැළකීම
   iii. පුස්තකාලය භාවිත කිරීමේ ඇති වැදගත්කම
   iv. ගසක් වවමු - රටක් හදමු
   v. බුදුදහමින් ඔපවත් වන අපේ සාරධර්ම

(ලකුණු 25)

02. (අ) ක්‍රියාපද යනු මොනවාදැයි හඳුන්වා, ක්‍රියාපදයක් ගොඩනැගෙන ආකාරය උදාහරණ සහිතව කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(ආ) ''බල'' ධාතුව පුරුෂත්‍රයේ වරනගන්න. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් ක්‍රියාපද කුමන ක්‍රියාපද ගණයට අයත්දැයි ලියා දක්වන්න.

   i. වැස්සොත්
   ii. සිනාසෙමින්
   iii. සැරදේවා
   iv. නැගිටිනු
   v. වැඳ

(ලකුණු 05)

03. (අ) පහත සඳහන් වාක්‍ය නිදොස් කර ලියන්න.

   i. සමහරෙක් අනුන්ගේ වැරදිම සොයයි.
   ii. තෙරණුවෝ දහම් දෙසුවේය.
   iii. නාය යාමෙන් කඳු කඩා වැටුණෝය.
   iv. සුළඟින් ගස්වැල් ඉදිරී වැටෙති.
   v. අම්මා ද, තාත්තා ද, මල්ලී ද ගමට යයි. (ලකුණු 10)

(ආ) පහත දැක්වෙන වචන වල ස්ත්‍රී ලිංග පද ලියන්න.

   i. කොවුලා ii. වලහා iii. කොකා iv. හංසයා v. බූරුවා

(ලකුණු 05)

04. (අ) පහත සඳහන් පද සඳහා සමාස පද ලියන්න

i. පිං පිණිස දෙන හාල්
ii. පා සතරක් ඇති
iii. දමනය වූ ඉඳුරන් ඇති
iv. ග්‍රහයන්ගෙන් වන දොස්
v. ලිපි කරනුයේ (ලකුණු 05)

(ආ) සිංහල භාෂාවේ සන්ධි ප්‍රභේද දහයකි. ඒවා පිළිවෙළින් ලියන්න. (ලකුණු 05)

(ඇ) විරාම ලක්ෂණ යොදා වාක්‍ය නැවත ලියන්න.

i. රාජකුමාරයෝ තෝ කවරෙක් දැයි විචාළෝය.
ii. වඳුරෝ ගසින් ගසට පැන පැන කුරුල්ලන්ගේ කුඩු කඩ කඩා උනුනට බොහෝ හිරිහැර කෙරෙති.
iii. මහරජ ඔබගේ රාජ්‍යයෙහි ශෂ්‍ය ජාතීහු සමෘද්ධි වෙත්වා
iv. ස්වාමීනි කුමක් කරම්ද
v. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටයකි යන්න බොහෝ දෙනාගේ අදහසකි (ලකුණු 05)

05. (අ) ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක්දැයි හඳුන්වා, තද්ධිත හා කෘදන්ත නාම වෙන් කර දක්වන්න. (ලකුණු 10)

(ආ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කර දක්වන්න.

i. මුනි + උතුමා ii. තුන් + රුවන් iii. වල් + අම්බලම
iv. අත් + කම් v. පස් + ඇස් (ලකුණු 05)

06. "වනකථා කෘතිය" තුළින් ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

07. බුදුගුණ අලංකාරය කාව්‍ය ග්‍රන්ථය තුළින් බුදුගුණ වර්ණනා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 15)

08. මහෞෂධ පණ්ඩිතයා සමාජ ප්‍රශ්නවලට විසඳුම් දුන් ආකාරය උමංදාව ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 15)